
# අකීකරු සදුනි



ජිතුලි බුලත්සිංහල

# අක්කරු සළුනි

කර්තෘ: ජිතුලි බුලත්සිංහල

ISBN 978-624-206-911-1

පළමු පිටපත හා මුද්‍රණය

2023 ඔක්තෝබර් 25

කතාව හා චිත්‍ර

ජිතුලි බුලත්සිංහල

2 වසර D

මහමායා බාලිකා විද්‍යාලය

මහනුවර.

# පිදුම

අයනු ආයනු කියා දී
වචන ගළපන්නට,
වාක්‍ය තනන්නට මට
කියාදුන් මගේ
ආදරණීය **ප්‍රමිතා
වෙත්තසිංහ ගුරු
මැණියන්ට** මේ පොත්
පිංච ආදරයෙන්
පුදකරමි.

# ස්තූතිය

මා හට මෙම පොත නිර්මාණය කිරිම සදහා උපදෙස් ලබා දුන් අප විදුහලේ විදුහල්පතිනියටත්, ප්‍රාථමික අංශයේ නියෝජ්‍ය විදුහල්පතිනියටත්, මාගේ ආදරණීය පන්තිභාර ගුරු මෑණියන්ටත්, මාගේ දෙමාපියන්ටත් මාගේ ස්තූතිය පිරිනමමි.

## පෙරවදන

වත්මන් අධ්‍යාපනයේ ඵලදායි පුරවැසියෙකු සතුටින් ජිවත් වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගිම අපේක්ෂාවයි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හදුනාගෙන ඒවා ඔපවත් කිරිම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස් වීම අපගේ වගකිමයි එම ජාත්ක අරමුණ මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්විම යටතේ ලේඛන කරණය සහජයෙන් උරුමකරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමු කිරිමේ ප්‍රතිඵලයක් ලෙස දේශිය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරිමට ලැබීම පාසලක් වශයෙන් ලැබු සුවිශේෂි ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලිමකි

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවිමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවිකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් " ව්‍යාපෘතිය හදුන්වාදෙන ලදි දරුවනට අත්දැකිම් සමුදායක් මෙන්ම ගත්කතුකරයෙකු විම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සලකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්විම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමිව අප පාසල විසින් සංවිධානය කල "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය එක්වු පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකිම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වු අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත්කරමින් එයට ජීවයක් වු සෙනවිරත්න මහලේකම්ගේ සේවයද අගයමි.

ශෂිකලා සේනාධීර
විදුහල් පතිනිය
මහමයා බාලිකා විද්‍යාලය - මහනුවර
2023.10.20



කඳුකරයේ ඇත

ගමක සඳුනි

කියලා ළමයෙක්

හිටියා. ඒ ළමයා

හරිම

හිතුවක්කාරයි.

දවසක් සඳුනිට

සිතුනා කැලෑවේ

ඇවිදින්න යන්න.

“අම්මේ, මම අද

කැලෑවේ



ඇවිදින්න යන්න
ද?” සඳුනි
අම්මාගෙන්
ඇසුවා. “තනියම
කැලෑවට යන්න
එපා දුවේ. ඔයාට

අනතුරක් වෙන්න

පුළුවන්.”අම්මා

කීවා.

සඳුනි අම්මා කියූ

කිසිවක් ඇහුවේ

නැහැ.



සඳුනි තනියෙන්ම
කැලයට ගියා.
හෙමින් හෙමින්
කැලය ඇතුළටම
ගියා. එයා හරිම
සතුටින් තමයි

කැලය ඇතුළට

ගියේ.

සඳුනිට කැලය

ඇතුලෙන් විවිධ වූ

ශබ්ද ඇසෙන්නට

වුණා. එයා

හොඳටම බය

වුණා. සඳුනි,

“අම්මා! අම්මා!”

කියා හයියෙන්

කෑ ගැසුවා. ඒත්

කවුරුත්ම ආවේ



නැහැ. කැලය ඇතුලේ සිට ලොකු වලහෙක් එයා දෙසට එනවා සඳුනි දැක්කා.

“අනේ මාව බේරා ගන්න කවුරුත් නැද්ද?” යි කියමින් සඳුනි කෑ ගසන්නට වුණා.

ඉතින් ඒ

වේලාවේ

කැලයේ දර

කපන්න ඇවිත්

සිටි මිනිසුන්

කණ්ඩායමකට

සඳුනිගේ කෑ

ගැසිල්ල ඇසුණා.

ඔවුන් දුවගෙන

සඳුනි ළඟට ආවා.

ඔවුන් සඳුනි



ඇගේ අම්මාට
භාර දුන්නා.
අම්මා ළඟට
දුවගෙන ගිය
සඳුනි “අනේ
අම්මේ මං ආය

කවදාවත් අම්මා

එපා කියන

දෙයක් කරන්නේ

නැහැ. මට

සමාවෙන්න”යයි

සඳුනි කිව්වා. “අර



මාමලා තමා මාව

බේර ගත්තේ”

සඳුනි කීවා.

“හොඳයි මගේ

දුවේ. අර මාමලාට

ඔයා බේරා

ගත්තට

බොහොම

ස්තූතියි කියලා

කියන්න”

ආය කවදාවත්ම

සඳුනි අම්මාට



හිතුවක්කාර නොවී හොඳ කීකරු දුවක් වීමට සිතට ගත්තා.

නිමි.

# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමඟ සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතුකොට ගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති කිරීම වැනි බහුවිධි පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුළ ගොඩනැඟී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබා දෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මඟපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැලසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.


මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කළ ව්‍යාපෘතියේ නිර්මාතෘ

2023.10.20